# ඇස්වහ කටවහ



ඇස්වහ, කටවහ, හෝවහ යන වචන අසන්න පවා අප අකැමැතිය. ඒ තරමටම ගුප්ත විද්‍යාව විසින් මේවා පිළිබඳ දීර්ඝ වූත් බියජනක වූත් විවරණ අප මනසට කාවද්දා ඇත. මිනිසා, සතා සිවුපාවා, ගහවැල, ගේ දොර, යාන වාහන ආදී අජීවී සියලු වස්තු මේ ත්‍රිවිධ දෝෂ යන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අප කරන්නා වූ පිළියම් අපමණය. අසවලා ළඟ බොහෝ ඇස්වහ ඇති බවත් අසවලා ළඟ බොහෝ කටවහ ඇති බවත් පුරාණේ ඇත්තෝ සිය අත්දැකීමෙන් දත්හ. ඒ නිසාම මෙම දෝෂ සහිත පුද්ගලයන් දක්නට පවා කවුරුත් කැමැති නැත. හොඳින් හඳුනා ගත හැකි මෙවන් "වහදෝෂ සහිත පුද්ගලයන් බිහි වන්නේ දහසකට එක් අයකු පමණි. අවශේෂ වශයෙන් සෑම පුද්ගලයකු ළඟම මෙවන් දෝෂ තත්ත්ව පැවැතීමට පුළුවන. අධිකතර වහදෝෂ ඇත්තෝ "සමාජ පිළිල" ලෙස සලකන්න ඇතැම්හු උත්සාහ දරති. දරුවකු උපදින විට පෙරුම්කායම් බැඳ රත් මලින් නහවා මොට්ටු තබා මුහුණ අවලස්සන වීම, විවිධ ලකුණු තබන්නේද පල සපිරි ගහ වැලට පිරිත් පැන් ඉස බාරහාර වී පඹයන් අඹා මිනිස් ඇසින් ආවරණ කොට තබන්නේද අලුතින් ඉදිවන ගේ දොර බලි රූප ඇඳ විවිධ වැකිවලින් සරසන්නේද අන් දෙයක් නිසා නොව මේ වහ දෝෂවලින් බේරා ගැනීම සඳහාය. මේ ත්‍රිවිධ වහ දෝෂයන්ගෙන් බේරීමට විරාත් කාලයක සිට ලෝකයේ බොහෝ දෙනා අද දක්වාම විවිධ ප්‍රතිකර්ම කරති.

## රසායනික සංඥාවක්

නූතන තාක්ෂණික විද්‍යාඥයන් විසින් ලෝක විෂය පිළිබඳ පුළුල් ලෙස අධ්‍යයනය කරයි. එසේ නමුත් ඇස්වහ, කටවහ, හෝවහ නමින් හඳුන්වන ත්‍රිවිධ "වහ" දෝෂයන්ගේ විද්‍යාත්මක සත්‍ය කුමක්දැයි මේ දක්වා හඳුනාගෙන නැත. විවිධ ජීවීන් යොදා ගනිමින් ඔවුන් නිකුත් කරන රසායනික සංඥා පිළිබඳ ලොව පුරා බොහෝ ජීව විද්‍යාඥයෝ පර්යේෂණ පවත්වති. එසේම ඒවා හරහා යම් යම් නිගමනද ලොවට හෙළිකරති. එසේ නමුත් මිනිසා එවැනි රසායනික සංඥා නිකුත් කරන්නේද යන්න තවමත් ලොවට හෙළි වී නැති අබිරහසකි. සැබැවින්ම මිනිසා එවැනි රසායනික සංඥා නිකුත් කරන්නේද ගවේෂණය කිරීමේදී ගුප්ත විද්‍යාව තුළ සැඟවුණු ප්‍රබල රසායනික සංඥා ත්‍රිත්වයක් හඳුනා ගතිමි. ඒ මා විසින් යට දක්වන ලද ඇස්වහ, කටවහ, හෝවහ යන ත්‍රිවිධ දෝෂය. මේවා මිනිසා විසින් විශ්වයට මුදා හරින ප්‍රබල විස සහිත රසායනික සංඥා විශේෂයක් වන අතර මීට අමතරව වලහගිනි, අඩවැඩියා ආදී වහ දෝෂද රසායනික සංඥා ලෙස මිනිසා විසින් නිකුත් කරයි. කිසියම් සත්ත්වයකු තමන්ගේ එක් ඉන්ද්‍රියක් පමණක් උපයෝගී කොට ගෙන එක් අරමුණක් උදෙසා තම රසායනික සංඥාව නිකුත් කරයි. නිදසුනක් ලෙස වවුලා නිකුත් කරන්නේ ශබ්දය කරණකොටගත් රසායනික ධ්වනි සංඥාවකි. Fabre හා කීට විද්‍යාඥ J. A. Linter විසින් අවුරුදු කිහිපයක් සලබයන් පිළිබඳව පරීක්ෂණ පවත්වන ලදී. එහිදී ඔවුහු අපූරු නිගමනයක් ලොවට හෙළි කළහ. එනම් ගැහැනු සලබයන් තම පිරිමි සලබයා ගෙන්වා ගැනීමට 10km පමණ දුරට රසායනික සංඥා නිකුත් කරන බවයි. මේ අදී වශයෙන් සත්ත්ව ලෝකයේ විවිධ සතුන් පිළිබඳවත් ඔවුන්ගේ රසායනික සංඥා පිළිබඳත් තතු ලොවට හෙළි වෙද්දී මිනිසා පිළිබඳ ඔවුන් නොසලකා හැරියේ මන්ද?

## සාහත්‍යකරුවාගේ මතය

පැරණි සාහිත්‍යයකරුවා විසින් මිනිසා කෙරෙන් නික්මෙන රසායනික සංඥා පිළිබඳ දුටු අයුරු අපූරුය.

කුරිරු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
මදුරු මැසි කැලැන්ගේ තුඩ'ගෙහි විසය
රුදුරු නුහුසුවන්ගේ වල'ගෙහි විසය
නපුරු දුදන්ගේ සියොළ'ගෙහිම විසය

(සුභාෂිතය - අලගියවන්න මුකවෙට්ටිතුමා)

මේ කවිය මැනැවින් අධ්‍යයනය කරන කල්හි මා විසින් යට දක්වන ලද මතය මැනැවින් ස්ඵුට නොවේද? නපුරු සිත් ඇති මිනිසුන්ගේ සර්වාංගයෙන්ම ප්‍රබල විස සහිත රසායනික සංඥා නිකුත් වන බව කියන්න හොඳම නිදසුන මෙය නොවේද "නානත්ථ කායා, නානත්ථ සංඥා" යන බුදු වදන වචනාර්ථයෙන් නොව ගැඹුරින් විමසා බැලූ කල මේ විද්‍යාත්මක සත්‍ය අපට මැනවින් පසක් වේ. නානාවිධ කාය ස්වරූප ඇත්තෝ නානාවිධ සංඥා නොහොත් සිතුවිලි දහරා විශ්වයට මුදාහරිති. ඇතමකුගේ රසායනික සංඥා කෙතරම් ප්‍රබලද යත් හිරු සඳු පවා අවනත වූ බව ඉතිහාස ගත සාක්ෂිවලින් පෙනේ. වේදබ්භ ජාතකය, කේවඩ්ඩ සූත්‍රය මේවාට කදිම නිදසුන් සපයයි. එපමණක් නොව අපි නූතන ලෝකය දෙසට හැරී බලමු. සිග්මන් ෆ්‍රොයිඩ්, එඩ්ගා කේසි වැන්නවුන් තම ප්‍රබල රසායනික සංඥා තුළින් අන් අය මෝහනය කිරීම, පෙර භවයන් කියැවීම ඇදී විස්මිත දේ කළහ.

## සිත ප්‍රබලයි

මිනිසා විසින් නිකුත් වන රසායනික සංඥා විස සහිත හා රහිත වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. අද අපි විමසා බලනුයේ මිනිසා කෙරෙන් නිකුත් වන විස සහිත ප්‍රබල රසායනික සංඥා මොනවද යන්නයි. අන් සතුන්ට වඩා මිනිසා විසින් නිකුත් කරන රසායනික සංඥා සඳහා ප්‍රබල ලෙස සිත බලපාන බව ඔබට කිවයුතුය. සර් ජගතීස් චන්ද්‍රබෝස් නම් මහා ඉන්දියානු විද්‍යාඥයා මිනිසා කෙරෙන් රතු හා නිල් පැහැති රැස් වළල්ලක් විහිදෙන බව ප්‍රකාශ කරයි. එහිදී ප්‍රසන්න වූ සිතුවිලි ඇත්තාගේ සිරුරෙන් නිල් වර්ණය අධික ලෙසත්, දුෂ්ට වූ සිතුවිලි ඇත්තාගේ සිරුරෙන් රතු වර්ණය වැඩි වශයෙනුත් පිට වන බව හෙළි කරයි. (සොබාදහම් ගොවිතැන - තිලක් කන්දේගම) මේ නිගමනයට අනුව මිනිසා සත්‍ය ලෙසම රසායනික සංඥා නිකුත් කරන බව අපට හෙළි වේ. එපමණක් නොව මා මුලින් සඳහන් කළ මනෝ චිකිත්සක එඩ්ගා කේසි විසින් කළු පැහැ රශ්මි දහරා නිකුත් කළ මිනිසුන් පිළිබඳ පරීක්ෂණ ගණනාවක් පවත්වා ඇත. එසේම 1901දී චාර්ල්ස් ලිඩ්බීටර් හා ඈනී බෙසන්ට් මහත්මිය ලියූ Thought Forms කෘතියේද මෙවැනි අඳුරු පැහැ රශ්මි දහරා විහිද වූ මිනිසුන් පිළිබඳ සඳහන් වේ. මේ සියල්ල ගෙන බැලූ කල අපට පැහැදිලි වන්නේ මිනිසා විසින් ප්‍රබල රසායනික සංඥා ගණනාවක් විශ්වයට මුදා හරින බව නොවේද?

## ඇස්වහ කාරයෝ


බොහෝ වහදෝෂ ඇති පුද්ගලයෝ වයස් ගතව ඉන්ද්‍රිය දුර්වලතාවලින් පෙළෙන්නෝ වෙති. පංච ඉන්ද්‍රිය සිරුරේ ඉන්ද්‍රිය හතරක්ම අඩපණ වූ කල එක් ඉන්ද්‍රියක් ප්‍රබල ලෙස ශක්තිමත් වේ. එයට හේතුව පෙර කී ඉන්ද්‍රිය හතරේම ශක්තිය විද්‍යුත් චුම්භක ක්ෂේත්‍රයන් හරහා නිරෝගී ඉන්ද්‍රිය වෙතට යොමුවීමයි.

නවත් සරලව පවසන්නේ නම් යමෙකුගේ කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් දුර්වල වී එහි ශක්තිය ඇස හරහා ගොස් ඇසේ පෙනීම ප්‍රබල කරයි. එහිදී ඇසේ දෘෂ්ටි විතානය, අක්ෂි ගෝලය, උත්තල කාචය ප්‍රබල ශක්ති කදම්බයක් බවට පත්වේ. අයහපත් සිතින් එවන් ඇසකින් යමක් දෙස බැලූ කල ප්‍රබල කිරණ ධාරාවක් එකී වස්තුව වෙතට ඇදී යයි. එය ප්‍රබල රසායනික සංඥාවක් බවට පත් වී එම වස්තුව විනාශවී යෑමට වුවද ලක් විය හැකිය. මෙවැනි ඇස් ඇති පුද්ගලයෝ 'ඇස්වහ කාරයෝ' යැයි සමාජය විසින් හඳුනා ගනී. මේ අය යමෙකු දෙස බලූ කල ඔහු රෝගාතුර වී මිය යෑමට පවා බැරි නැත. සරු අස්වැන්නක් හෝ වෙනත් වස්තුවක් දෙස බැලූ කල එය පිලිස්සී, වියළී, ඉරි තැළී යෑමට පවා ඉඩ තිබේ. සැබැවින්ම මේ ක්‍රියාවලිය සිදුවන්නේ කෙසේද? එයට බලපාන නූතන විද්‍යාත්මක සංකල්පය පහත දැක්වෙන රූප සටහන ඇසුරින් විමසා බලමු. උත්තල කාචයක් හරහා ආලෝක කිරණයක් ගමන් කිරීමට සැලැස්වූ කල එහි නාභියේදී ප්‍රබල රශ්මි කදම්භයක් උපකා ගත හැකිය. යම් හෙයකින් එකී නාභියට ගිනි ගන්නාසුලු යමක් තැබූ විට එය වහා ගිනි ගනී. "ඇස්වහ" ඇති පුද්ගලයාගෙන්ද සිදුවන්නේ මේ දේමය.

මෙවන් පුද්ගලයන් වටා රතු සහ කළු පැහැති රශ්මි දහරා වැඩි වශයෙන් පවතින අතර දූෂිත වූ සිතුවිලි සහිතව කල් ගෙවන බවද දක්නට පුළුවන.

## කටවහ

මා ඉහතින් දැක්වූ පරිදි කන, ඇස, නාසය, ශරීරය ආදී ඉන්ද්‍රියන් අඩපණ වූ යමෙකුගේ එකී ශක්තිය දිව ප්‍රධාන කොට ගත් මුඛය වෙත යොමු වේ. එහිදී 'කටවහර' ප්‍රබල විද්‍යුත් චුම්භක ශක්ති කදම්භයක් ලෙස විශ්වයට මුදා හරියි.




රූප සටහන

මෙහිදී ඔහු කෙරෙන් නිකුත් වන වචනත් සමඟම ප්‍රබල රසායනික සංඥාවක්ද නිකුත් වේ. යම් කෙනෙක් හෝ වස්තුවක් අරබයා මෙම සංඥාව නිකුත් වනවාත් සමඟම ප්‍රබල රසායනික ක්‍රියාවලියක් හට ගනී. එහි අවසාන ප්‍රතිඵලය එකී වස්තුවට හෝ ජීවියාට හානි පැමිණීමයි. මේ පිළිබඳ ඔබ හොඳාකාරවම දන්වා ඇත. කටවහ කාරයකු විසින් "මෙදා පාර කුඹුර සරු සාරෙට පැහිලා තියෙනවා" යැයි කීවොත් පසුදා කුමන හෝ උවදුරකට ලක්ව කෙත විනාශ වී යයි. මෙහිදී සිදුවූයේ කුමක්ද? ඔහු නිකුත් කළ සංඥාව ප්‍රබල රසායනිකයක් බවට පත්වීම නොවේද? ඇතැම් කටවහ ඇත්තන්ගේ කියුම් නිසා එවලේම ප්‍රතිඵල ලැබෙන බව සමාජයේ තතු දන්නෝ දනිති.

## හෝ වහ

අපි මුලින් දැන ගත් පරිදි මිනිසාගේ සිරුරෙන් විහිදෙන රශ්මි මාලාව 'හෝවහ' ලෙස හැඳින්විය හැකිය. යමකුගේ කන, ඇස, නාසය, දිව ආදී ඉන්ද්‍රියන් දුර්වල වෙත්ම ඒවායේ ගැබ්වූ ශක්තිය ශරීරයේ සම් ආවරණයෙන් පිටතට විහිදේ. මෙම රශ්මි දහරාවන් තද රතු හෝ කළුවන් වර්ණවලින් යුතුවේ. ඇඩි මෝහය, ලෝභය, වෛරය, තණ්හාව, ආශාව ඇති පුද්ගලයන් තුළින් නිරන්තරයෙන්ම ඉහත කී අඳුරු පැහැ රැස් දහරාවන් විශ්වයට නිකුත් වේ. ඒවා රසායනික සංඥා බවට පත් වී ඇතැම් විට පාරිසරික සාධක පවා වෙනස් කරයි. මෙසේ හෝවහ ඇත්තකුගේ සිතුවිලි යම් මොහොතක එක්තැන් වී එයින් හට ගන්නා රසායනික සංඥා විද්‍යුතය බවට පත්වීම සිදුවේ. එම විද්‍යුතය ශරීරයේ රෝමෝද්ගමනය (රෝම කූප) හරහා පරිසරයට මුදාහැරීමේදී එයට හසුවන සෑම අජීවී සජීවී වස්තුවක්ම විනාශ වීමට හෝ අඩපණ වීමට පුළුවන. එය එසේ නම් අලගියවන්න මුකවෙට්ටිතුමා පවසන 'නපුරු දුදනන්ගේ සියොළගෙහිම විසය' යන යෙදුම කොතෙක් සත්‍ය දැයි ඔබට සිතා ගත හැකිය.

ඇස්වහ, කටවහ, හෝවහ පිළිබඳ මාගේ ගවේෂණයට අනුව එක් නිගමනයකට එළඹුණෙමි. මේ සියලුම වහදෝෂ විකිරණශීලී රසායනික සංයෝගයන් බව මාගේ හැඟීමයි. අපේ පංච ඉන්ද්‍රියන්ගේ සැකැස්ම නූතන විද්‍යාවට අනුව පරමාණුවෙන් ආරම්භ වේ. මෙසේ පරමාණු බොහෝ ගණනාවක් එකතුවී අපේ සිරුර නිර්මාණයවී ඇත. මෙම සිරුරේ එක් එක් ඉන්ද්‍රියය වයසට යෑමත් සමඟ දුර්වල වීමේ දී ඒ ඉන්ද්‍රිය තුළ ඇති පරමාණුක න්‍යෂ්ටි ක්ෂය වී එයින් කිරණයක් මුදා හරියි. එම කිරණ 'විකිරණ' නමින් හඳුන්වයි. එම විකිරණ වර්ග තුනකින් හඳුනා ගත හැකිය. ඒ ඇල්ෆා, බීටා, ගැමා වශයෙනි. මෙසේ විනාශ වී යන ඉන්ද්‍රියෙන් නිකුත් වන කිරණ සක්‍රිය එක් ඉන්ද්‍රියක් වෙතට ගොස් වඩා ශක්තිමත් හා ප්‍රතිඵල එකක් බවට පත් කරයි. එම ඉන්ද්‍රිය විසින් එකී විකිරණ විශ්වයට මුදාහරින අතර එයට හසුවන ජීවී සෛලය විනාශයට පත්වේ. මෙම සිද්ධාන්තය ගුප්ත විද්‍යාව තුළ වහ දෝෂ ලෙසින් හඳුන්වා ඇත.


පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක
උපුල් එස්. දෙඹේපොළ
0772042708